// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2269/73 - 2022 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2022.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, කුරුවිට නව ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල පවිත්‍රාගාරයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/RN/443.
2022 පෙබරවාරි මස 25 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**උපලේඛනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 155, කුරුවිට ග්‍රාම නිලධාරි වසමේ කුරුවිට ගමේ පිහිටි ගුරුබැල්කඩහේන නමැති ප්‍රමාණයෙන් පර්චස් 14 ක පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මුර කුටිය සහ ටැංකිය ; |
| *නැගෙනහිරට* | : | හිස් ඉඩම සහ හව් කුළුණ ; |
| *දකුණට* | : | හිස් ඉඩම සහ යෝජිත ජල පිරිපහදුව ඉදිකරන ඉඩම ; |
| *බටහිරට* | : | තේ ඉඩම සහ නිවස. |


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : බී. එස්. ඉන්දුකා රත්නසිරි මිය,
අංක 385/2, පාලුවත්ත පාර,
පණුකැරැපිටිය.

බී. පියරත්න මයා,
අංක 361/ A,
සිනමාහල පාර,
කුරුවිට.

EOG 03 - 0759

---

ශුද්ධිපත්‍රය

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියට අනුව නගර සැලසුම් ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් 2019.03.26 දිනැතිව හා අංක 2116/30 සහිතව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඇහැලියගොඩ නව ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල නියමයේ උපලේඛනයේ සඳහන් ඉඩම් ප්‍රමාණය පර්චස් 60 ක් ලෙස සඳහන් වුවත් **එය පර්චස් 85 ක් ලෙස සංශෝධනය** විය යුතු බව 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජල සම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර වන මම මෙයින් ප්‍රකාශයට පත්කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/KE/428.
2022 පෙබරවාරි මස 22 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර", අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

EOG 03 - 0760

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.